# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1948/60 - 2016 ජනවාරි මස 08 වැනි සිකුරාදා - 2016.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 (1) වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, (2015 අප්‍රේල් මස 07 දින අංක 1909/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන්වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තිය ප්‍රකාරව එකී පනතේ 21 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලැබූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ ශ්‍රී ලංකාවේ රුහුණු විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වනු ලබන්නා වූ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ ''ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය'' යන අයිතමයට අනුරූපවන්නා වූ උපලේඛනයේ II වැනි තීරයේ ''සාරස විද්‍යා අධ්‍යයනාංශය'' යන අයිතමයට වෙනුවට පහත දක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් 2008 සැප්තැම්බර් මස 19 වැනි දින අංක 1567/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''සාරස විද්‍යා හා ජල තාක්ෂණ අධ්‍යයනාංශය''

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

01 - 900

1A - PG 2772 — 507 (2016/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*